28 MAR 2017

SW/593/2017

සිආදෙ 3/5/2- I

2017.03.23

අභ්‍යන්තර චක්‍රලේඛ අංක 02/2015(III)

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
සියළුම අධ්‍යක්ෂ වරුන්/ නියෝජ්‍ය අධ්‍යක්ෂ වරුන්/ සහකාර අධ්‍යක්ෂ වරුන්,
සියළුම අංශ භාර නිලධාරීන්,
සියළුම බලකා භාර අණදෙන නිලධාරීන්/ පුහුණු පාසල් භාර අණදෙන නිලධාරීන්,
හා ව්‍යාපෘති භාර නිලධාරීන් වෙත.

<u>රජයේ ආයතන සහ නිලධාරීන් සඳහා සන්නිවේදන පහසුකම් සැපයීම සහ බිල්පත් නිරවුල් කිරීම</u>

උක්ත මැයෙන් නිකුත් කළ 2015.02.16 දිනැති හා අංක 02/2015 , 2015.05.12 දිනැති හා 02/2015(I) හා 2016.05.12 දිනැති හා 02/2015(II) අභ්‍යන්තර චක්‍රලේඛ හා බැඳේ.

02. 2017 අයවැය යෝජනාවන්ට අනුව දුරකතන හා සන්නිවේදන මාධ්‍යන් සඳහා වූ බදු මුදල් වැඩිකර ඇති බැවින් හා සෑම බලකා මූලස්ථානයක් සඳහාම අන්තර්ජාල පහසුකම ලබාගත් බැවින් උක්ත චක්‍රලේඛයේ 3 වන ඡේදයෙහි දක්වා ඇති "බලකා භාර අණදෙන නිලධාරීන් හා පුහුණු පාසල් අණදෙන නිලධාරීන් සඳහා නියමව තිබූ උපරිම වියදම් සීමාව" ඇතුළත් වගන්තිය පහත පරිදි සංශෝධනය වේ.

> "බලකා භාර අණදෙන නිලධාරීන් හා පුහුණු පාසල් අණදෙන නිලධාරීන් සඳහා නියමව තිබූ උපරිම වියදම් සීමාව, අදාල දුරකතනය කාර්යාලයීය පොදු දුරකතනයක් ලෙස සළකා දුරකතන ඇමතුම් ගාස්තු, අන්තර්ජාල පහසුකම සඳහා වන මුදල හා බදු මුදලද ඇතුළත්ව රු.9500.00ක් ලෙසද, ව්‍යාපෘති භාර නිලධාරීන් සඳහා රු.4500.00ක් ලෙසද ඇතුලත් වේ."

03 දෙපාර්තමේන්තුව තුළ සිදු කරන ලිපි හුවමාරු කිරීම විද්‍යුත් තැපැල මගින් සිදු කරන ලෙස දන්වා සිටින අතර ෆැක්ස් භාවිතය අවම කිරීමට කටයුතු කරන ලෙස ද අවධාරණය කෙරේ.

04. මෙම චක්‍රලේඛය මගින් සංශෝධිත විධිවිධාන 2017/01/01 දින සිට අදාල කර ගත යුතු අතර අංක 02/2015 , 02/2015(I) හා 02/2015(II) යන චක්‍රලේඛයන් හි සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසම ක්‍රියාත්මක වේ.

**චන්ද්‍රරත්න පල්ලේගම**
**අධ්‍යක්ෂ ජනරාල්**
**සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව**
**නො: 23, දුම්රියපොළ පාර,**
**බම්බලපිටිය, කොළඹ-04.**

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත - ලේකම් , ආරක්ෂක අමාත්‍යාංශය